සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved ]

කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ
ZONAL EDUCATION OFFICE - HORANA

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023
General Certificate of Education (Adv. Level) Examination, 2023
13 ශ්‍රේණිය-අවසාන වාර පරීක්ෂණය, 2023 නොවැම්බර්
Grade 13 - Year End Evaluation, November 2023

සංයුක්ත ගණිතය II
Combined Mathematics II

10 S II

23' AL API ( PAPERS GROUP )

**B කොටස**

*ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

11.(*a*) $A$ හා $B$ දුම්රිය ස්ථාන දෙකක් අතර දුර $d\ km$ වේ. $u\ kmh^{-1}$ වේගයෙන් $A$ පසුකරන $P$ දුම්රියක් $a\ km$ දුරක් යන තුරු එම වේගය පවත්වා ගෙන ගොස් ඉන්පසු ඒකාකාර ලෙස මන්දනය වී $B$ හි දී නිසලතාවයට පත්වේ. $P$ දුම්රිය $A$ පසුකර ගෙන යාමට පැය $T$ කාලයකට පෙර $A$ හි දී නිශ්චලතාවයේ සිට පිටත් වන $Q$ දුම්රියක් එක්තරා කාලයක් ඒකාකාර ලෙස ත්වරණය වී $\lambda u\ kmh^{-1} (\lambda < 1)$ වේගයක් ලබාගත් මොහොතේ සිට ඒකාකාර ලෙස මන්දනය වී $P$ දුම්රිය පැමිණෙනවාත් සමග $B$ හි දී එකවර නිශ්චලතාවයට පත් වේ.

$P$ හා $Q$ දුම්රිය දෙකේ චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාර, එකම රූප සටහනක අඳින්න.

ඒ නයින්, i) $T = \dfrac{2d}{\lambda u} + \dfrac{a}{u} - \dfrac{2d}{u}$ බව ද

ii) $P$ දුම්රියේ මන්දනය $\dfrac{u^2}{2(d-a)} kmh^{-2}$ බව ද

iii) $Q$ දුම්රියේ ත්වරණය හා මන්දනය පිළිවෙළින් $f_1 kmh^{-2}$ හා $f_2 kmh^{-2}$ නම්

$$\frac{1}{f_1} + \frac{1}{f_2} = \frac{2d}{\lambda^2 u^2}$$ බව ද පෙන්වන්න.

(*b*) සතුරු බෝට්ටුවක් ඊට බටහිරින් $30^0$ ක් උතුරින් $d\ km$ දුරක් ඈතින් පිහිටි නැවක් දකියි. මෙම නැව $u\ kmh^{-1}$ වේගයකින් නැගෙනහිරට ගමන් කරයි. නැව හමුවීම සඳහා සතුරු බෝට්ටුව $v\ kmh^{-1}$ නියත වේගයකින් ගමන් කරයි.

(*i*) $v < \dfrac{u}{2}$ නම් සතුරු බෝට්ටුවට නැව වෙත ළඟා විය නොහැකි බව පෙන්වන්න.

(*ii*) $\dfrac{u}{2} < v < u$ නම් සතුරු බෝට්ටුව නැව වෙත ළඟා වීමට ගත වන අවම කාලය

පැය $\dfrac{d}{2(u^2 - v^2)}\left(\sqrt{3}u - \sqrt{4v^2 - u^2}\right)$ බව පෙන්වන්න.

12. (a) ප්‍රිස්මයක මධ්‍ය හරස්කඩ $ABC$ ත්‍රිකෝණයකි. $A\hat{C}B = \frac{\pi}{2}, C\hat{A}B = \alpha\left(>\frac{\pi}{4}\right), AB = a$ වේ. ස්කන්ධය $M$ වන ප්‍රිස්මය $AB$ සුමට තිරස් මේසයක් ස්පර්ශ කරමින් නිසලව පවතියි. එකක ස්කන්ධය $m$ වන සමාන අංශු දෙකක් $C$ ඉහළම ලක්ෂ්‍යයේ තබා ප්‍රිස්මයේ $CA, CB$ පාද ඔස්සේ පහළට ලිස්සා යෑමට ඉඩ හරිනු ලැබේ. $\sqrt{\frac{2g}{a}\cot\alpha}$ කාලයක් ප්‍රිස්මය නිසලව පවතින බව ද, ඉන් පසු $\frac{mg\sin\alpha\cos\alpha}{M + m\cos^2\alpha}$ ත්වරණයෙන් චලනය වන බව ද පෙන්වන්න.

(b) දිග $a$ වූ $AB$ ලුහු අවිතන්‍ය තන්තුවක $A$ කෙළවර අචල ව සවිකර $B$ කෙළවරට $m$ ස්කන්ධයක් ඈඳා තිබේ. තන්තුව නොබුරුල්ව, තිරස්ව පිහිටන සේ තබා මුදා හළ විට $A$ ට සිරස්ව පහළින් $B$ පිහිටන මොහොතේ දී තන්තුවේ $C$ ලක්ෂ්‍යය ක්ෂණිකව අචල වේ. ඉන්පසු $BC$ කොටස නොබුරුල්ව පවතින සේ $m$ ස්කන්ධය $C$ වටා යන්තමින් පූර්ණ වෘත්තයක් ගෙවා යයි.

i) $BC = \frac{2a}{5}$ බව පෙන්වන්න.

ii) $C$ ට සිරස්ව ඉහළින් $B$ පිහිටන විට $m$ ස්කන්ධයෙහි ප්‍රවේගය සොයන්න.

iii) $m$ ස්කන්ධය, $C$ වටා පූර්ණ සිරස් වෘත්තයක් ගෙවා යන විට තන්තුවේ උපරිම හා අවම ආතති සොයන්න.

23' AL API ( PAPERS GROUP )

13. $0$ අචල ලක්ෂ්‍යයක කෙළවරක් ගැටගසා ඇති ස්වභාවික දිග $a$ වූ, සැහැල්ලු ප්‍රත්‍යාස්ථ තන්තුවකින් ස්කන්ධය $m$ වූ, $P$ අංශුවක් එල්ලූ විට, තන්තුව $3a$ දිගක් ඇදෙයි. තන්තුවේ ප්‍රත්‍යාස්ථතා මාපාංකය සොයන්න.
දැන් $P$ අංශුව $0$ අචල ලක්ෂ්‍යයට ගෙන ගොස් සීරුවෙන් මුදා හරිනු ලැබේ. තන්තුව යන්තමින් ඇදී ඇති විට $P$ අංශුවේ ප්‍රවේගය සහ ඒ සඳහා ගතවන කාලය සොයන්න.

$x(>a)$ යනු $t$ කාලයේදී තන්තුවේ දිග යැයි සිතමු. අංශුවෙහි ප්‍රවේගය $\dot{x}$ නිර්ණය කිරීම සඳහා සමීකරණයක් ලියන්න. එම සමීකරණය, $\ddot{y} + \frac{g}{2a}y = 0$ ආකාරයේ බව පෙන්වන්න. මෙහි $y = x - 3a$ වේ.

$y$ සඳහා $y = A\cos\omega t + B\sin\omega t$ ආකාරයේ විසඳුමක් උපකල්පනය කරමින් $A, B, \omega$ නියත සොයන්න.
ඒ නයින් $y$ හි උපරිම අගය නිර්ණය කර ඒ සඳහා $P$ අංශුවට ගතවන මුළු කාලය සොයන්න.
$y$ හි උපරිම අගය ලබාගන්නා විට $P$ අංශුව සර්වසම ස්කන්ධය $m$ වූ, $Q$ අංශුවක් සමග ගැටී බද්ධ වෙයි. සංයුක්ත අංශුවේ නාභිය සහ විස්තාරය සොයා $0$ අචල ලක්ෂ්‍යයේ සිට $(7-2\sqrt{2})a$ දුරකදී එය ක්ෂණිකව නිසලතාවයට පත්වන බව පෙන්වන්න.

14. (a) O මූලයක් විෂයෙහි $A$ හා $B$ ලක්ෂ්‍යවල පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ වේ. $\overrightarrow{OA} = 2\overrightarrow{BC}$ වේ. $OB$ රේඛාව $1:1$ අනුපාතයට ද, $AC$ රේඛාව $2:1$ අනුපාතයට ද බෙදන ලක්ෂ්‍ය පිළිවෙලින් $P$ හා $Q$ වේ. $Q$ හි පිහිටුම් දෛශිකය $\frac{2}{3}(\underline{a}+\underline{b})$ බව පෙන්වන්න.

$OQ$ හා $AP$ රේඛා එකිනෙකට ලම්බක නම් $\underline{a}$ හා $\underline{b}$ දෛශික අතර කෝණය $\cos^{-1}\left(\frac{|\underline{b}|}{|\underline{a}|} - 2\frac{|\underline{a}|}{|\underline{b}|}\right)$ බව පෙන්වන්න.

දික් කරන ලද $AO$ හා $QP$ සරල රේඛා $R$ හි දී ඡේදනය වෙයි නම් $AO:OR = 1:2$ හා $QP:PR = 1:3$ බව සාධනය කරන්න.

23' AL API ( PAPERS GRO

(b) $ABCD$ යනු පාදයක දිග $a$ හා $B\hat{A}D = 60^0$ වන රොම්බසයකි. විශාලත්ව $P, P, P, P, P, \sqrt{3}P$ හා $\sqrt{3}P$ වූ බල පිළිවෙලින් $\overrightarrow{AB}, \overrightarrow{BC}, \overrightarrow{CD}, \overrightarrow{AD}, \overrightarrow{BD}, \overrightarrow{DE}$ හා $\overrightarrow{BF}$ ඔස්සේ ක්‍රියා කරයි. මෙහි $E$ හා $F$ යනු පිළිවෙලින් $AB$ හා $CD$ පාදවල මධ්‍ය ලක්ෂ්‍ය වේ.

i) බල පද්ධතියේ සම්ප්‍රයුක්ත බලයේ විශාලත්වය $\sqrt{7}P$ බව පෙන්වා, එහි දිශාවත් ක්‍රියා රේඛාව $AB$ ඡේදනය කරන ලක්ෂ්‍යයට $B$ සිට දුරත් සොයන්න.

ii) දැන් බල පද්ධතියට එම තලයේම වූ බල යුග්මයක් ද $AC$ හා $BD$ ඔස්සේ ක්‍රියා කරන $Q$ හා $R$ බල දෙකක් ද යොදනු ලැබේ. නව පද්ධතිය සමතුලිතව පවතී නම් $Q$ හා $R$ බල දෙකේ විශාලත්ව $P$ ඇසුරින් සොයා බල යුග්මයේ විශාලත්වය සහ දිශාව සොයන්න.

15. (a) පිළිවෙලින් $3a, 4a, 4a, 3a$ දිගැති $AB, BC, CD$ හා $DA$ ඒකාකාර දඬු හතරක් $A, B, C, D$ ලක්ෂ්‍යවල දී සුමට ව අසව් කර තිබේ. දඬුවල $a$ දිගක බර $W$ වේ. $5a$ දිගැති සැහැල්ලු අවිතන්‍ය තන්තුවක් මගින් $A$ හා $C$ සම්බන්ධ කර ඇත. පද්ධතිය $A$ ගෙන් නිදහසේ එල්ලෙමින් පවතියි.

i) $B$ සන්ධියේ ප්‍රතික්‍රියාවේ විශාලත්වය සහ දිශාව සොයන්න.

ii) $AC$ තන්තුවේ ආතතිය $\frac{212}{25}W$ බව පෙන්වන්න.

(b) $A, B, C$ හා $D$ ලක්ෂ්‍යවල දී සුමට ලෙස සන්ධි කළ සැහැල්ලු දඬු පහකින් සමන්විත රාමු සැකිල්ලක් රූපයේ දක්වේ. $A$ හි දී අචල ලක්ෂ්‍යයකට අසව් කර රාමු සැකිල්ල සිරස් තලයක සමතුලිතව තබා ඇත්තේ $B$ හි දී යොදන ලද $P$ තිරස් බලයක් මගිනි. $BC$ හා $DA$ දඬු තිරස් වන අතර $C$ හා $D$ ලක්ෂ්‍යවල $W$ බැගින් වූ භාර යොදා ඇත. $A\hat{C}B = D\hat{A}C = \alpha$ වේ. $P = W\frac{(1+\cos^2\alpha)}{\sin\alpha\cos\alpha}$ බව පෙන්වන්න.




බෝ අංකනය භාවිතයෙන්, ප්‍රත්‍යාබල සටහනක් අඳින්න. $AC$ දණ්ඩේ ප්‍රත්‍යාබලය $3W$ නම් $\alpha$ හි අගය සොයන්න. අනෙක් දඬුවල ප්‍රත්‍යාබල ආතති ද තෙරපුම්ද යන්න සඳහන් කරමින් ඒවායේ විශාලත්වය සොයන්න.

16. අරය $r$ වූ ඒකාකාර තුනී කුහර අර්ධ ගෝලයක ස්කන්ධ කේන්ද්‍රය, කේන්ද්‍රයේ සිට $\frac{r}{2}$ දුරකින් පිහිටන බව පෙන්වන්න.




කේන්ද්‍රය $O$ හා අරය $a$ වූ ඒකාකාර තුනී අර්ධ ගෝලාකාර කබොලකට රූපයේ පරිදි කබොලෙහි ගැටවෙහි $A$ ලක්ෂ්‍යයට දිග $2l$ වූ ඒකාකාර සිහින් දණ්ඩක් දෘඪ ලෙස සවිකිරීමෙන් හැන්දක් සාදා ඇත. අර්ධ ගෝලයේ ඒකක වර්ගඵලයක ස්කන්ධය $l\sigma$ ද, දණ්ඩේ ඒකක දිගක ස්කන්ධය $\sigma$ ද වේ.

හැන්දේ ස්කන්ධ කේන්ද්‍රය $OA$ සිට පහළට $\frac{\pi a^3}{2(\pi a^2+1)}$ දුරකින්ද, $O$ හරහා යන සිරස් රේඛාවේ සිට $\frac{a+l}{\pi a^2+1}$ දුරකින් ද පිහිටන බව පෙන්වන්න.

හැන්ද, වක්‍රාකාර පෘෂ්ඨය සුමට තිරස් මේසයක් මත ගැටෙන සේ තැබූ විට, හැන්දේ මිටෙහි අග කෙළවර මේසයේ නොගැටී පැවතීමට නම් $\pi a^2 > 12\sqrt{6}$ විය යුතු බව පෙන්වන්න. මෙහි $l = 2a$ වේ.

17.(a) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ එක්දින තරගවල පන්දුවට පහර දුන් අවස්ථාවල දී කණ්ඩායමේ නායකයා ලබාගත් ලකුණු පිළිබඳ අතීත වාර්තා වලට අනුව පහත තොරතුරු අනාවරණය කර ගෙන ඇත. 10 ට අඩු ලකුණක් ලබා ගැනීම 40% හා 50ට වැඩි ලකුණක් ලබා ගැනීම 25% කි. 10 ට අඩු ලකුණක් ලබා ඇති විට තරගය ජය ගැනීමේ සම්භාවිතාව $\frac{1}{4}$ කි. 50 ට වැඩි ලකුණක් ලබා ගත් විට තරගය ජය ගැනීමේ සම්භාවිතාව $\frac{4}{5}$ කි. අතීත වාර්තා අනුව ඔහුගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම තරගයක් ජය ගැනීමේ සම්භාවිතාව 55% කි.

i) නායකයා තරගයක දී 10 ට වැඩි 50 ට අඩු ලකුණක් ලබා ඇති විට තරගය ජය ගැනීමේ සම්භාවිතාව සොයන්න.

ii) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම තරග ජයග්‍රහණයක් ලබා ඇති විට, නායකයා ලකුණු 10 ට වඩා අඩු ගණනක ට දැවියාමේ සම්භාවිතාව සොයන්න.

(b) පුස්තකාලයක සවස් වරුවලදී පැමිණි පාඨකයන් පිළිබඳ වන සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් පහත දැක්වේ. එහි එක් සංඛ්‍යාතයක් අඩුව ඇත.

23' AL API ( PAPERS

| පාඨකයන් ගණන | 2-8 | 9-15 | 16-22 | 23-29 | 30-36 | 37-43 | 44-50 | 51-57 |
|---|---|---|---|---|---|---|---|---|
| දින ගණන | 2 | 3 | 4 | 9 | 6 | $f$ | 2 | 1 |

වැඩිම පාඨකයන් ගණනක් 23-29 පන්ති ප්‍රාන්තරයේ ඇතැයි සලකා, ව්‍යාප්තියෙහි මාතය නිර්ණය කරන්න.

ව්‍යාප්තියේ මධ්‍යන්‍යය 27.4 වන බව දනියි. 37-43 පන්තියේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස ගෙන $f$ සොයන්න.

ඉහත දී ඇති ව්‍යාප්තියේ සම්මත අපගමනය $(\sigma)$ නිමානය කරන්න.

කවද $k = \frac{\mu - M}{\sigma}$ මගින් අර්ථ දක්වනු ලබන කුටිකතා සංගුණකය $k$ ගණනය කරන්න. මෙහි මධ්‍යන්‍යය හා මාතය පිළිවෙලින් $\mu$ හා $M$ මගින් දැක්වෙයි.

***